*සියලුම හිමිකම් ඇවිරිණි*
*All Rights Reserved*

**වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව**

# දෙවන වාර පරීක්ෂණය 2019

# පෙරදිග සංගීතය

**7 ශ්‍රේණිය** **කාලය පැය 2 යි.**

| නම/ විභාග අංකයඃ |
|---|

## I - කොටස

- සියලුම ප්‍රශ්නවලට නිවැරදි පිළිතුරු සපයන්න.
- අංක 01 සිට 10 දක්වා ප්‍රශ්න සඳහා වඩාත් නිවැරදි පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.

01 සප්තකයට අයත් විකෘති ස්වර සංඛ්‍යාව කීයද?

(1) 2 කි. (2) 5 කි. (3) 7 කි. (4) 12 කි.

02 සප්තකයක ඇති අචල ස්වර පිළිවෙලින් වන්නේ,

(1) සච්ජය හා මධ්‍යමය (2) මධ්‍යමය හා පංචමය

(3) සච්ජය හා පංචමය (4) රිෂභය හා ධෛවතය

03 කෝමළ ස්වර හැඳින්වීම සඳහා භාවිතා වන සංකේතය වන්නේ,

(1) ස්වරයට උඩින් තිතක් තැබීම. (2) ස්වරයට උඩින් දකුණට ඇලව ඇල ඉරක් තැබීම.

(3) ස්වරයට යටින් තිතක් තැබීම. (4) ස්වරයට යටින් ඉරක් ඇඳීම.

04 ''^'' ''/'' යන ආඝාත නිපදවිය හැකි භාණ්ඩය වන්නේ,

(1) යක්බෙරය (2) රබාන (3) තාලම්පට (4) තබ්ලාව

05 සුෂිර වාද්‍ය භාණ්ඩයක් <u>නොවන්නේ</u> මින් කුමක් ද?

(1) මෙලෝඩිකාව (2) මවුත්ඕගනය (3) රෙකෝඩර් ෆ්ලූට් (4) ග්ලොකන් ස්පීල්

06 උපදේශාත්මක ගීතයක් වන්නේ මින් කුමන ගීතය ද?

(1) නොමග නොයන් පුතේ (2) රත්නදීප ජන්ම භූමි

(3) ලෝකෙන් උතුම් රට (4) අඹ දඹ නාරං කෙසෙල් දෙල්

07 ''ගැමි ගී'' වර්ගයට අයත් ගී විශේෂයකි

(1) දේශාභිමානී ගී (2) දරු නැළවිලි ගී (3) සරල ගී (4) ළමා ගී

08 පහතරට නර්තන සම්ප්‍රදාය ආභාෂයෙන් පෝෂණය වී ඇති රංග ශෛලියකි

(1) නූර්ති (2) නාඩගම් (3) කෝළම් (4) සොකරි

09 පෙර අපර දෙදිගම භාවිතා වන සංගීත භාණ්ඩය වන්නේ,

(1) එස්රාජය (2) වීණාව (3) සිතාරය (4) වයලීනය

10 ''තෙලෙන් බැද්දත් කොබෙයියා
කිරෙන් බැද්දත් කොබෙයියා''

යන පද්‍ය වාදනය කිරීමට උචිත භාණ්ඩයකි

(1) රබාන (2) තාලම්පට (3) හොරණෑව (4) සර්පිනාව

- **අංක 11 - 15 දක්වා වරහන් තුළ දී ඇති පිළිතුරු වලින් හිස්තැනට වඩාත් සුදුසු පිළිතුර තෝරා ලියන්න.**

(මිශ්‍රාබය / දරු නැළවිලි ගී / ලෙංචිනා / අත් රබාන / මැන්ඩලීනය)

11 ලෝකයේ විවිධ ජාතීන් අනුව .................................................................... නිර්මාණය වී ඇත.

12 ........................................................ වාදනය කරමින් කවි ගායනයත් සමග නර්තනයේ යෙදෙයි.

13 කෝලම් රංග ශෛලියේ එන චරිතයකි ..................................................................

14 වයලීනයේ තත් සුසර කරන ආකාරයට තත් සුසර කරන භාණ්ඩය .................................................. වේ.

15 සිතාරය වාදනය කිරීම සඳහා .................................................................................. භාවිතා කරනු ලැබේ.

- **අංක 16 - 20 දක්වා ඇති ප්‍රකාශ හරි නම් (✓) ලකුණ ද, වැරදි නම් (✗) ලකුණ ද ඉදිරියේ ඇති වරහන් තුළ යොදන්න.**

16 සර්පිනාව වාදනයේ දී ඇඟිලි 5 ම යොදා ගැනේ. ( )

17 ගිටාරයේ ප්‍රධාන තත් සංඛ්‍යාව 6 කි. ( )

18 සප්තකයක ඇති කෝමළ ස්වර සංඛ්‍යාව 2 කි. ( )

19 කෝලම් ගී ගායනයේ දී අත්වැල් ගායනය සිදුවේ. ( )

20 ''පොතපත කියවා දැනුම ලබා'' ගීතය ශුද්ධ ස්වරස්ථාපන ගීතයකි. ( ) (ලකුණු 1 x 20 = 20)

## II කොටස

- **පළමු ප්‍රශ්නය ඇතුළුව ප්‍රශ්න තුනකට පමණක් පිළිතුරු සපයන්න.**
- **පළමු ප්‍රශ්නය අනිවාර්ය වේ.**

01 (i) ඔබ වාදනය සඳහා තෝරාගත් (යතුරු පුවරු භාණ්ඩ හැර) භාණ්ඩයේ දළ රූප සටහනක් අඳින්න. (ලකුණු 04)

(ii) එහි ශුද්ධ ස්වර සප්තකය පිහිටන ආකාරය පැහැදිලිව දක්වන්න. (ලකුණු 06)

02 (i) කෝමළ ගාන්ධාරය හා නිෂාදය යෙදෙන ස්වරස්ථාපන ගීතයක් ගීත ස්වර ප්‍රස්තාර කරන්න. (ලකුණු 08)

(ii) එම ගීතයට තාල වාදනයට සුදුසු හින්දුස්ථානී තාලය නම් කරන්න. (ලකුණු 02)

03 (i) කෝලම් නාට්‍ය ගීතයක් ලියන්න. (ලකුණු 05)

(ii) කෝලම්වල එන චරිත 3 ක් නම්කර ඔබ සිත්ගත් චරිතයක රූප සටහනක් අඳින්න. (ලකුණු 05)

04 (i) රබන් වාදනය සිදුකරනු ලබන අවස්ථා 2 ක් ලියන්න. (ලකුණු 02)

(ii) ඔබ කැමති රබන් පදයක් හා ගීතයක් ලියන්න. (ලකුණු 08)

05 පහත සඳහන් මාතෘකාවලින් එකක් තෝරාගෙන පාද 4 කට නොඅඩු ගී පදමාලාවක් නිර්මාණය කරන්න.

(i) මුහුද (ii) වැස්ස

(iii) ගුරුතුමිය (iv) පාසල (ලකුණු 10)

## පිළිතුරු පත්‍රය - I කොටස

| | | | | | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| (01) | 2 | (02) | 3 | (03) | 4 | (04) | 3 | (05) | 4 | (06) | 1 | (07) | 2 | (08) | 3 |
| (09) | 4 | (10) | 1 | (11) | දරුනැළවිලි ගී | | | (12) | අත් රබාන | | | (13) | ලෙංචිනා | | |
| (14) | මැන්ඩලීනය | | | (15) | මිශ්‍රාබය | (16) | ✓ | (17) | ✓ | (18) | ✗ | (19) | ✓ | (20) | ✗ |

(ලකුණු 1 x 20 = 20)

## II කොටස

01 (i) භාණ්ඩයේ ව්‍යුහය නිවැරදිව ප්‍රදර්ශනය විය යුතුයි. (ලකුණු 04)

(ii) ස්වරස්ථාන අතර පරතරය පිළිබඳ සලකා ලකුණු පිරිනමන්න. (ලකුණු 06)

02 (i) ස්වරස්ථාපන ගීතයේ ගු , නි නිවැරදිව ලකුණු කර ඇත්නම් ල. 6 යි. පද ප්‍රස්තාරයට ල. 2 (ලකුණු 08)

(ii) හින්දුස්ථානී තාලය නම් කිරීමට (ලකුණු 02)

03 (i) කෝළම් ගීතයට පද පේළි 4 ක් සෑහේ. (ලකුණු 05)

(ii) චරිත 3 ට, රූප සටහනට (ලකුණු 3 + 2 = 05)

04 (i) විවිධ උත්සව අවස්ථා සුවිශේෂීව නම් කිරීම (ලකුණු 02)

(ii) රබන් පදය හා රබන් ගීතය ලිවීමට (ලකුණු 2 + 6 = 08)

05 පදමාලාවේ අදහස හා නිර්මාණාත්මක බව සළකා බලා ලකුණු පිරිනමන්න. (ලකුණු 10)

සියලුම හිමිකම් ඇවිරිණි
All Rights Reserved

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

# දෙවන වාර පරීක්ෂණය 2019

7 ශ්‍රේණිය

# පෙරදිග සංගීතය

## ප්‍රායෝගික පරීක්ෂණය

01 කෝමල ගු නි යෙදෙන ස්වරස්ථාපන ගීතය ගායනය / වාදනය කරන්න. (ලකුණු 10)

02 ඔබ කැමති හින්දුස්ථානී තාලයක් අතින් තාල දමා පෙන්වන්න. (ලකුණු 10)

03 රබන් / දරු නැළවිලි ගී වර්ග දෙකක් එක් ගීතයක් ගායනය කරන්න. (ලකුණු 10)

04 රබන් පදයක් වාදනය කරන්න. (ලකුණු 10)

(මේ සඳහා ගැටබෙරය, දවුල, අත් රබාන, මේසය යොදාගන්න.)

05 ස්වර පුවරු භාණ්ඩයකින් ඔබ කැමති ස්වර අභ්‍යාසයක් අ/අව වාදනය කරන්න. (ලකුණු 10)

(මුළු ලකුණු 50)